www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වාර්තාගත ආදායම් අහිමි වීමකට මුහුන දී සිටින එක්සත් ජනපද ප්‍රාන්ත රාජ්‍ය අත්‍යවශ්‍ය සේවා කපා හරියි

## Facing record loss of revenue, US states gutting essential services

2010 මැයි 21

කැලිෆෝර්නියා, නිව් යෝර්ක් සහ තවත් දුසිම් ගනනක් එක්සත් ජනපද ප්‍රාන්ත රාජ්‍යයන්හි ආන්ඩුකාරවරු 2010 ජූලි 1 න් ඇරඹෙන 2011 මූල්‍ය වර්ෂය සඳහා උග්‍ර වියදම් කැපීමේ යෝජනාවන් ඉදිරිපත් කර තිබේ. ආර්ථික අවපාතය, ඉහල විරැකියා අනුපාත හා බදු ආදායමේ වාර්තාගත තියුනුම කඩා වැටීම හමුවේ ප්‍රාන්ත රාජ්‍ය ලමුන්, වැඩිහිටි පුරවැසියන් සහ වැඩකරන ජනතාව මත විනාශකාරී බලපෑමක් ගෙන ඒමට නියමිත අත්‍යවශ්‍ය සේවා කප්පාදුවක් ක්‍රියාත්මක කර තිබේ.

අර්බුදය ග්‍රීසිය, පෘතුගාලය, එංගලන්තය සහ අනෙකුත් රටවල් තුලදී මුලුමහත් ජාතීන්ම බංකොලොත්භාවයට හෝ බංකොලොත්කමේ ආසන්නයට ඇද දැමීමේත්, ගෝලීය බැඳුම්කර වෙලඳපොලවල් හා "ජාතික නය" වෙලෙන්ඳන්ගේ කස පහර හමුවේ ක්‍රියාත්මක වන ජාතික ආන්ඩු කප්පාදු සඳහා කෙරෙන ඉල්ලීම්වලත්, රූපය ගෙන තිබේ.

එක්සත් ජනපදය තුලදී ඔබාමා පාලන තන්ත්‍රය, ආර්ථික අර්බුදයේ බරෙන් වැඩි ප්‍රමානයක් ප්‍රාන්ත රාජ්‍ය හා පලාත් පාලන ආයතන මතට හෙලා තිබේ. වෝල් වීදියේ බැංකු හා මූල්‍යායතන වලට ඇපබැඳීමටත් යුද්ධ දෙකකට වැය කිරීමටත් මුදල් ට්‍රිලියන ගනනක් වෙන් කරන ධවල මන්දිරය, ප්‍රාන්ත සහ පලාත් ආන්ඩු හාමතට දමා ඇති අතර ෆෙඩරල් උත්තේජක වැඩසටහන්වලින් ඒවාට ලබාගත හැකිව තිබූ සොච්චම් මුදල් ප්‍රමානය ද සිඳීයමින් තිබේ.

අයවැය සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිලිබඳ මධ්‍යස්ථානයට අනුව, 2010-2011 මූල්‍ය වර්ෂයේදී ප්‍රාන්ත රාජ්‍ය ඩොලර් බිලියන 375ක ඒකාබද්ධ හිඟයකට මුහුන දී සිටිති. පසුගිය වසර 10 පුරා අවම වසයෙන් ප්‍රාන්ත රාජ්‍ය 45ක් අධ්‍යාපනය, සෞඛ්‍යය සහ අඩු ආදායම් පවුල් සඳහා සහන වැඩ සටහන් කපාහැර ඇත; 30ක් නිගාමී වැට් බදු හා ගාස්තු ඉහල නංවා ඇත; 42ක් රැකියාවලින් දොට්ට දැමීම්, නොගෙවූ නිවාඩු දීමනා සහ කුලී ඇවිරීම් හරහා වැටුප් පිරිවැය කපාහැර තිබේ. 2008 අගෝස්තු සිට, ප්‍රාන්ත හා පලාත් ආන්ඩු කපා හැර ඇති රැකියා ගනන 192,000කි.

අයවැය කප්පාදුවේ නව වටය වඩා ගැඹුරුවී ඇත්තේ, මහා අවපාතයෙන් අනතුරුව ආන්ඩුවේ පිහිටාධාර ඉහලින්ම අවශ්‍යව ඇති මොහොතේ ය.

රටේ වඩාත්ම ජනාකීර්න ප්‍රාන්තය වන කැලිෆෝර්නියාවේ ආන්ඩුකාර ආර්නෝල්ඩ් ස්වසනේගර් පසුගිය සතියේදී ඩොලර් බිලියන 12.4ක් කැපීමේ සැලසුම් විස්තර කලේය. තුනෙන් දෙකක් ලමයින්ගෙන් සමන්විත මිලියන 1.4ක ජනතාවට සෙත සැලසූ ප්‍රාන්තයේ කැල්වර්ක්ස් සුභසාධන වැඩපිලිවෙල අහෝසි කිරීම ද මෙම කුරිරු කප්පාදුවේ කොටසකි. ආබාධිත පවුල් සාමාජිකයන් නඩත්තු කරන දුගී නිවැසියන්ට ගෙවූ දීමානාවන්ගෙන්, ආහාර මුද්දර, සුව ආරක්ෂන, මානසික සෞඛ්‍ය, අධ්‍යාපනය සහ රාජ්‍ය සේවක වැටුප් හා දීමනාවන් තවත් බිලියන ගනනකින් කපාහරිනු ඇත. ප්‍රාන්තීය මෙඩි-කල් වැඩසටහන සඳහා සැපිරිය යුතු සුදුසුකම් වැඩි කිරීමෙන්, ගෙවීම් ඉහල නංවීමෙන්, වෛද්‍යවරයෙකු හමුවීමේ අවස්ථාව වසරකට දහවතාවකට සීමා කිරීමෙන්, ශ්‍රවන ආධාරක හා අනෙකුත් වෛද්‍ය උපකරන වෙනුවෙන් වූ ආධාර පහත හෙලීමෙන්, හිඟ පියවීම ක්‍රියාත්මක කෙරෙයි. රැකියා විරහිතයන් සහ දුප්පතුන් උදෙසා සුව ආරක්ෂනයට පැවති ප්‍රවේශයන් අවහිර කරනු ඇත.

තමා පිලිගන්නාවූ "කප්පාදුව මුලුමනින්ම දරුනු" යයි නිවේදනය කරමින් රිපබ්ලිකන් ආන්ඩුකාරවරයා තත්වය යුරෝපයට සන්සන්දනය

කලේය. "ඔබ බලන්න ග්‍රීසියේ සිදුවෙමින් තියෙන්නේ කුමක්ද කියලා, බලන්න අයර්ලන්තය දිහා, දැන් ස්පාඤ්ඤයේ සිදුවෙමින් ඇත්තේ කුමක්දැයි විමසන්න. දැඩි තෝරාගැනීම් මිස කිසිවක් අපට ඉතිරිව නැත."

නව අයවැයකින් ප්‍රාන්තයේ ඩොලර් බිලියන 9.2ක හිඟය පියවන තෙක්, රාජ්‍ය සේවකයින් ලක්ෂයක් සතියකට දිනක් පඩි රහිතව වැඩවල නිරත කිරීමේ සැලසුම් ඩිමොක්‍රටිකයෙකු වන නිව්යෝර්ක්හි ආණ්ඩුකාර ඩේවිඩ් පැටර්සන් නිවේදනය කලේය. ගුරුවරුන් 15,000කගේ රැකියාවලට කනකොකා හඬවමින් ප්‍රාන්තීය අධ්‍යාපන අධාරවලින් බිලියන 1.1ක් කපා දැමීමට දැනටමත් ඔහු යෝජනා කර තිබේ. සුව ආරක්ෂන සැපයුම්කරුවන්ට ගෙවන දීමානා ද සුව අරක්ෂනයේ අනෙකුත් කප්පාදු කිරීම් ද ඇතුලුව තවත් බිලියන ගනනක් කැපීමටත් නියමිතය. සිටි වාර්ෂික විද්‍යාල සඳහා අරමුදල් සහ තරමක් හොඳ ආදායමක් සහිත පවුල් සඳහා මූල්‍ය ආධාර කපා හැරීමටත් යෝජනා කෙරී ඇත. එයට අතිරේක වසයෙන්, නිව්යෝර්ක් නගරයට ප්‍රාන්තීය ආදායම බෙදාදීම අහෝසි කිරීමටත් අනෙකුත් නගරවලට අඩුකිරීමකටත් පැටර්සන් යෝජනා කර ඇත.

ප්‍රකෝටිපතියෙකු වන නගරාධිපති මයිකල් බ්ලූම්බර්ග් යෝජනා කර තිබෙන අයවැය සැලසුමෙන් ජාතියේ විශාලතම විද්‍යාල පිහිටි නිව්යෝර්ක් නගරයේ ගුරුවරුන් 4,419ක් රැකියාවලින් දොට්ට දමනු ඇත. එමෙන්ම  ගිනි නිවන භටයන් 400කගේ රැකියා කපාහැරීම, නගරයේ වැඩිහිටි හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන දුසිම් ගනනක් වසා දැමීම, පුස්තකාල හා කලා කටයුතු උදෙසා කෙරෙන වියදම් විශාල ලෙස කප්පාදු කිරීම ද ඔහුගේ යෝජනාවන්ට ඇතුලත්ය.

රටේ ඉහලම විරැකියා අනුපාතය සහිත මිචිගන්හි ඩිමොක්‍රටික් ආන්ඩුකාර ජෙනිෆර් ග්‍රැන්ඩ්හෝල්ම් රාජ්‍ය සේවකයන් හා ගුරුවරුන් දහස් ගනනකට විශ්‍රාම ගැනීමට බලකලේ පුරප්පාඩුව පවතින රැකියා සංඛ්‍යාවෙන් තුනෙන් එකක් අහෝසිකර දමන අතරතුරය. දැනට සේවයේ නියුතු කම්කරුවන් සඳහා ගෙවීමට නියමිත වැටුප් වර්ධක අහෝසි කිරීමට නියමිත අතර නවක රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාමිකයන් උදෙසා සෞඛ්‍ය දීමනාවන් අඩු කරනු ඇත. අතිරේක වසයෙන් උසස් අධ්‍යාපනයට කරන වියදම් අඩු-කිරීමෙන් අඩු ආදායම්ලාභී සිසුන් 15,000ක් වෙත පිරිනැමෙන පාසැල් ශිෂ්‍යත්ව වැඩ පිලිවෙල අහෝසි කරනු ඇත.

වැඩකරන වයසේ පසුවෙන ජනගහනයෙන් සියයකට 50කට පූර්න-කාලීන රැකියාවක් හිමි නැති සහ අමානුෂික කොන්දේසිවලින් නොනැසී සිටීමට මඟක් සොයන දස දහස් ගනනක් ජීවත් වන ඩිට්‍රොයිට්හි, දශලක්ෂපතියෙකු වන නගරාධිපති ඩේවිඩ් බින්ග් නාගරික කම්කරුවන්ගේ තියුනු වැටුප් කප්පාදුවක්, සේවාවන් පෞද්ගලීකරනය කිරීමක් හා තවත් විද්‍යාල 45ක් වසා දැමීමේ සැලසුම් සකස් කිරීමට සහ නගරයේ නඩත්තු කිරීමට වඩාත් දුෂ්කරයැයි ඇස්තමේන්තු කල සියලුම ආයතන වසා දැමීමටත් අනකරමින් සිටියි.

රටේ අනෙකුත් සියලුම ප්‍රාන්ත සහ නගරවලම පාහේ නොඉවසිය හැකි එවන් කප්පාදු ක්‍රියාත්මකය. එමගින් කාලකන්නිකම හා විනාශය පමනක් උත්පාදනය කරනු ඇත.

ඔබාමා පාලන තන්ත්‍රයේ සිට ආන්ඩුවේ සෑම මට්ටමකම ඩිමොක්‍රටික් හා රිපබ්ලිකානුවන් දක්වා සමස්ථ දේශපාලන සංස්ථාපිතයම, කම්කරු පන්තිය ආර්ථික අර්බුදය වෙනුවෙන් වන්දි ගෙවිය යුතුය යන මතයේ එල්බ සිටිති.

එක්සත් ජනපදයේ සහ ලෝකය පුරා කම්කරුවන් එලෙස වන්දි ගෙවිය යුතුයැයි ඔවුන් අවධාරනය කරන්නේ, වෝල් වීදියේ මූල්‍ය අධිපතියන් ඇදහිය නොහැකි පෞද්ගලික ධනසම්භාරයක් ගොඩ ගසමින් සිටින තතු තුලය. ඇත්ත වසයෙන් නම්, ජාතීන්, ප්‍රාන්ත, රාජ්‍යය, හා නගර බංකොලොත් වීම ධනවත් සමපේක්ෂකයන්ට තවත් ලාභදායී ප්‍රභවයකි.

මෑත ආයෝජන වාර්තාවක් ඇගවුම් කල පරිදි ඩොලර් බිලියන 2 ක වත්කමකට හිමිකම් කියන පිම්කෝ නම් ගෝලීය ආරක්ෂක අරමුදලේ ප්‍රධානියාට අනුව "යුරෝපයේ අවිනිශ්චිත භාවය, ලාභ-පිපාසිත ආයෝජකයන් වෙනුවෙන් ආකර්ෂනීය, බද්දෙන්-නිදහස් ඩොලර් ට්‍රිලියන 2.6ක පලාත් පාලන බැඳුම්කර වෙලඳපොලක් නිර්මානය කර ඇත. ප්‍රාථමික අයවැය සමයට එලැඹෙමින් සිටින මොහොතේ, තමන්ගේ අයවැය තුලනය කරගැනීමේ අරගලයක නිරතව සිටින ප්‍රාන්ත අත්හැර දමා එම කාර්යට සාර්ථක ලෙස අතගසා සිටින ප්‍රාන්ත වෙත අවධානය යොමු කිරීමට" ඔහු උපදෙස් දුන්නේය.

මූල්‍ය ප්‍රභූවේ ඇස් ඉදිරියේ රජයේ විද්‍යාල, රෝහල්, පවිත්‍රකරන පද්ධති සහ විනෝද

මධ්‍යස්ථානවලට වැයවෙන සෑම සතයක්ම තමන්ගේ බලගතු ලාභයට අනවශ්‍ය සහ ඉවසුම් නොදෙන අඩුවීයාමකි. ඒ අනුව සමාජ වැඩසටහන් කරටියට ම කපා දැමිය යුතුය.

දේශපාලඥයින් සහ මාධ්‍ය, ආර්ථිකයේ සුගතිය වෙනුවෙන් කම්කරු පන්තියට දරුනු ප්‍රහාර එල්ල කිරීම හා කප්පාදුවල අවශ්‍යතාව ගැන තොරතෝංචියක් නැතිව කෑ ගහන අතරේ යථාර්ථය නම්, සුපිරි ධනවතුන්ගේ පුද්ගලික වාසනාව සහ සංගතවල ලාභවලට කෙලවරක් නැතිව අරමුදල් යෙදවීමට සමාජයට නොහැකි බවයි.

කෙසේවෙතත්, පාලක පන්තිය සහ ජනගහනයේ අති බහුතරය අතර මෙම තරගකාරී හිමිකම් පෑම විසඳිය හැකිවන්නේ පන්ති අරගලය ඔස්සේ පමනි.

සල්ලිවලට විකිනුනු හා වැටුප් ලබන මහ ධනපති පක්ෂ දෙකේ දේශපාලඥයින් සහ ඔවුන් සමග හවුල් වූ වෘත්තීය සමිති සංවිධාන අයවැය හිඟ අඩුකිරීමේ අවශ්‍යතාව ගැන කරන සියලු කථා කම්කරුවන් විසින් ප්‍රතික්ෂේප කල යුතුය. අර්බුදයට සමාජවාදී විසඳුමක් ඉදිරිපත් කිරීමට කම්කරු පන්තියේ නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුය. කප්පාදුව වෙනුවට, වැඩකරන ජනතාව, එනම් සිය සාමූහික ශ්‍රමයෙන් සමාජයීය ධනය නිර්මානය කරන්නවුන්ගේ යහපත් ජීවන තත්වයන් සහතික කිරීම සඳහා ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කල යුතුය.

මූල්‍ය ප්‍රභූව අයථා ලෙස ඉපයූ ලාභ අත්පත් කරගෙන, ආර්ථික අර්බුදය සමයේදී තමන්ගේ රැකියා, නිවාස සහ ඉතුරුම් අහිමි වූ කෝටි සංඛ්‍යාත කම්කරුවන්ගේ හිතසුව පිනිස ඒවා යෙදවිය යුතු බව සමාජවාදී සමානතා පක්ෂය කියා සිටියි.

නගර යලි ගොඩනැගීම හා ජාතියේ දිරාපත් වෙමින් යන යටිතල ව්‍යුහය ප්‍රතිසංස්කරනය කිරීම තුල, විරැකියාවට වැටී සිටින 15 මිලියනයක ඇමරිකානුවන්ට යලි රැකියා දීම සඳහා ඩොලර් ට්‍රිලියන ගනනක පොදු වැඩ පිලිවෙලක් දියත් කල යුතුය. සියලු දෙනාටම සුරක්ෂිත වැටුපක්, ඉහල-ගුනාත්මක අධ්‍යාපනයක්, සුව ආරක්ෂනය සහ නිවාස සහතික කිරීමට, ප්‍රජාතාන්ත්‍රිකව සැකසූ සැලස්මකට අනුකූලව සමාජයේ සම්පත් බෙදාහැරීමට හැකිවෙන අයුරින් බැංකු පොදු ව්‍යාපාර බවට පරිවර්තනය කල යුතුය.

ජෙරී වයිට්

© www.wsws.org